# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700 | ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823 | වෙබ් අඩවිය / வெப்சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: පීඊඩී/ඊඑස්ඩී/01/04 | ඔබේ අංකය / உமது இல. / Your No.: | දිනය / திகதி / Date: 2009.07.21

රාජ්‍ය මුදල් චක්‍රලේඛ : පීඊඩී/439

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත,

<u>වෙරළ සංරක්ෂණ කටයුතු සඳහා රාජ්‍ය අංශයේ භාවිතයෙන් ඉවත් කරනු ලබන ටයර් නැවත ප්‍රයෝජනයට ගැනීම</u>

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2009.06.02 වන දින, වෙරළ ඛාදනය සම්බන්ධව පැවැති විශේෂ රැස්වීමේ දී, අධික මුහුදු ඛාදන තත්ත්වය මත මුහුදු වෙරළ තීරයට සිදුවන බරපතල හානිය සහ ඒ හේතු කොට ගෙන දේපල හා නිවාසවලට සිදුවන හානිය පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී. එහිදී, ශ්‍රී ලංකාව වටා ඇති ඛාදනයට ලක්වෙමින් පවත්නා වෙරළ තීරය ඉතා ඉක්මණින් සංරක්ෂණය කිරීමේ වැදගත්කම දැඩිලෙස අවධාරණය කරන ලදී.

02. මෙහිදී, දේපල හා නිවාසවලට බරපතල හානි සිදුවෙමින් පවත්නා වෙරළ තීරයන්, නොපමාව සංරක්ෂණය කිරීමේ ක්ෂණික පියවරක් වශයෙන් අධික ලෙස මුහුදු ඛාදනයට ලක්වන ස්ථාන, භාවිතයෙන් ඉවත් කළ ටයර් යොදා ආරක්ෂා කිරීමේ කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව මෙම වැඩපිළිවෙල අප්‍රමාදව ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයතන විසින් භාවිතයෙන් බැහැර කරනු ලබන සියළුම ටයර්, වෙන්දේසි කිරීමේ ක්‍රියාවලියෙන් බැහැරව මෙම කාර්යය සඳහා යෙදවා ගැනීමට තීරණය කර ඇත.

03. එබැවින්, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල භාවිතයෙන් බැහැර කර ඇති හා ඉදිරියේ දී භාවිතයෙන් බැහැර කරනු ලබන සියළුම ටයර් දැනට ක්‍රියාත්මක වන වෙන්දේසි කිරීමේ ක්‍රියාවලියට ඉදිරිපත් නොකොට, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට මෙයින් උපදෙස් දෙමි. එලෙස භාර දෙනු ලබන ටයර් පිළිබඳව වූ ලේඛණ අදාල ආයතන විසින් නඩත්තු... නුවමාරු කර ගත යුතු වන අතර, එම ලේඛණ විගණන කටයුතු සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

04. මෙම ටයර් ලබාගැනීමේ ක්‍රමවේදය දැනටමත් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සකස් කර ඇති හෙයින්, මේ පිළිබඳව අවශ්‍ය පැහැදිලි කරගැනීම්, එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ දුරකතන අංක 011-2449197 / ෆැක්ස් අංක 011-2438005 හෝ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) ගේ දුරකතන අංක 011-2329440 / ෆැක්ස් අංක 011-2387115 ඇමතීමෙන් ලබාගත හැකි බව වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

එස්. අබේසිංහ,
භාණ්ඩාගාර ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම් - අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්, 2009.06.02 දින පැවැති සාකච්ඡාවේ දී එළඹි තීරණ හා බැඳේ.
2. ලේකම්, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය
3. අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

} මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ අවශ්‍ය උපදෙස් රාජ්‍ය ආයතනවලට ලබාදීම සඳහා

4. විගණකාධිපති - දැ.ගැ.ස.